දෙවන වාර පරීක්ෂණය* 2018

මතුගම අධ්‍යාපන කලාපය

| නාට්‍ය හා රංග කලාව | 9 | කාලය පැය 02 යි |
|---|---|---|

නම -------------------------------------- පන්තිය ------

සැලකිය යුතුයි

- ❖ ප්‍රශ්න පත්‍රය i කොටස හා ii කොටස වශයෙන් කොටස් දෙකකින් යුක්තයි .
- ❖ i කොටසේ ප්‍රශ්න සියල්ලටම හා ii කොටසේ පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න දෙකකටද පිළිතුරු සැපයිය යුතුයි.

---

i කොටස

පහත ප්‍රශ්න වලට දී ඇති වරණ අතරින් වඩාත් නිවැරදි වරණය තෝරා යටින් ඉරක් අඳින්න.

(1) නාට්‍ය පෙළක් රචනා කිරීමේදී රචකයා මුලින්ම තීරණය කළ යුත්තේ
(1) නාට්‍යය තේමාව හා ශෛලියයි (2) ජීවන දෘෂ්ඨියයි
(3) චරිත හා නළු නිළියන් පිළිබඳවයි (4) ආනුෂංගික අංග පිළිබඳවයි

(2) නාට්‍ය පෙළක අනිවාර්යෙන්ම අන්තර්ගත විය යුතු වන්නේ
(1) කථා සාරාංශය (2) පාත්‍ර වර්ගයා
(3) ඝට්ඨනය හෙවත් ගැටුමයි (4) ගීතයි

(3) නාට්‍යයක චරිතයක ස්වභාවය හඳුනා ගැනීමට වඩාත් ඉවහල් වන්නේ
(1) වේෂ භූෂණයි (2) නාට්‍යෝපකරණයි
(3) ආලෝකයයි (4) වේදිකා පසුතල නිර්මාණයි

(4) නාට්‍යයක ශෛලියට අනුව ආනුෂංගික කලාවන්
(1) වෙනස් වේ (2) වෙනස් නොවේ
(3) වෙනස් නොවුනාට කමක් නැත (4) සමහර අංග පමණක් වෙනස් වීම ප්‍රමාණවත්ය

(5) නාට්‍යයක අවස්ථා තීව්‍ර කිරීම සඳහා වඩාත්ම යොදා ගත හැකි ආනුෂංගික අංගය වන්නේ
(1) සංගීතයයි (2) වේෂ භූෂණයයි (3) අංග රචනයයි (4) ආලෝකකරණයයි

(6) සමාරෝපය යන්න හැඳින්වීම සඳහා වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න
(1) නළුවෙක් තවත් චරිතයකට ආරෝපණය වීම
(2) නළුවෙක් ආවේශ වීම (3) අභ්‍යන්තර චිත්ත ඒකාග්‍රතාවය ඇතිකර ගැනීම

(4) නළුවෙක් වෙස්වලා ගැනිම

(7) නළුවෙකු තුළ නොතිබිය යුතු ගුණාංගයකි
(1) කැපවීම (2) අන්අය අභිබවා යාම (3) අන්මත ඉවසීම (4) නිහතමානී බව

(8) කදා වළලු නාට්‍යයේ පරමාදර්ශී චරිතය ලෙස පෙන්නුම් කරන්නේ
(1) සේරි වානිජ වෙළෙන්දාය (2) කච්ඡපුට වෙළෙන්දාය
(3) මිත්තණියයි (4) සිටු දියණියයි

(9) ලෝක ස්වභාවයට බොහෝ සමානව අනුකරණය කරන නාට්‍ය ශෛලිය හඳුන්වන නම
(1) නාට්‍ය ධර්මී (2) ලෝක ධර්මී (3) ශෛලිගත (4) අර්ධ ශෛලිගත

(10) නිශ්චිත ගණිතමය ක්‍රමයකට අනුව වෙන්කල චලන
(1) ස්වාභාවික චලනයි (2) නිර්මිත චලනයි (3) තාලානුකූල චලනයි (4) අංග චලනයි

නාට්‍ය කලාවේ භාවිතාවන තාක්ෂණික වචන කීපයක් හා සම්බන්ධ අදහස් කීපයක් 11 සිට 15 දක්වා
ප්‍රශ්න වලින් දැක්වේ. ඒවායේ නොගැලපෙන ප්‍රකාශය තෝරන්න.

(11) <u>ගැටුම</u>
(1) ගැටුම නාට්‍යයක තිබිය යුතු ප්‍රබල ලක්ෂණයයි
(2) ගැටුම තුළින් ප්‍රේක්ෂකයාව නාට්‍ය වෙතින් ඈත් කරණු ලබයි
(3) ගැටුම විවිධ ප්‍රභේද වලින් යුක්තයි
(4) ගැටුම තුළින් ආතතියක් හට ගනී

(12) <u>චරිත</u>
(1) චරිත යනු නළු නිළියන්ය (2) චරිත යනු පාත්‍ර වර්ගයාට තියන තවත් නමකි
(3) චරිතයක විවිධ භූමිකා පවතී (4) චරිතයකට ආවේනික ලක්ෂණ ඇත

(13) <u>අනුකරණය</u>
(1) සාර්ථක අනුකරණයකට සතර අභිනයම යොදාගත යුතුය
(2) එක් අයෙකු නිරූපණය කරන චරිතයම තවත් අයෙකු ඒ ලෙසම ඉදිරිපත් කිරීම
(3) කෙනෙකුගේ චරිතය වෙනස් කර පෙන්වීම
(4) චරිත නිරූපණය සඳහා අනුකරණය ප්‍රයෝජනවත් වේ

(14) <u>අභිනය</u>
(1) නාට්‍යයක් ප්‍රේක්ෂකයා ඉදිරියට පැමිණවීමේ මාධ්‍ය
(2) අභිනයේ ප්‍රභේද හතරකි (3) අභිනය නාට්‍ය ශෛලියට අනුව වෙනස් නොවේ
(4) චරිතයක ප්‍රබල හෝ දුබලබව ඉස්මතු වීම කෙරෙහි අභිනය බලපායි

(15 <u>අංග රචනය</u>
(1) නළුවාගේ භූමිකාට වඩාත් තීව්‍ර කිරීම මේ මගින් බලාපොරොත්තු වේ
(2) නළුවා භූමිකාවට සමාරෝපය කිරීම මේ මගින් සිදුවේ
(3) නළුවාගේ මුහුණ අලංකාර කිරීම මෙහි අරමුණ වේ
(4) නාට්‍යයේ රංග ශෛලියට අනුව මෙහි වෙනස්කම් සිදුවේ



1



2

(16) ඉහත පළමු රූපයෙන් දැක්වෙන නාට්‍යකරුවා වන්නේ
(1) එදිරිවීර සරච්චන්ද්‍ර, (2 ) හෙන්රි ජයසේන,
(3 ) දයානන්ද ගුණවර්ධන (4) බන්දුල ජයවර්ධන

(17) ඉහත දෙවන රූපයෙන් දැක්වෙන රංගන ශිල්පිනිය වන්නේ
(1) රම්‍යා වනිගසේකර (2) සෝමලතා සුබසිංහ
(3) මැණිකේ අත්තනායක (4) චන්ද්‍රා කළුආරච්චි

පහත දක්වා ඇති වගුවෙහි හිස්තැන් වලට දී ඇති වචන අතරින් ගැලපෙන වචනය පමණක් තෝරා නිවැරදිව සම්පූර්ණ කරන්න.

( එදිරිවීර සරච්චන්ද්‍ර, හෙන්රි ජයසේන, දයානන්ද ගුණවර්ධන,කළු හාමි, ගමරාළ, නරිබෑණා, එළොව
ගිහින් මෙළොව ආව, ජනකතා , ජාතක කතා )

| **නාට්‍ය පෙළෙහ නම** | **චරිත** | **මූලාශ්‍රය** | **නිෂ්පාදක** |
|---|---|---|---|
| **(19)** ----------------- | **නරියා** ------------- | ----------------- | ------------------ |
| **(20)** ----------------- | ---------- **කළු අප්පු** | ----------------- | ------------------ |

(ලකුණු 20×1 =20 )

ii කොටස

සැලකිය යුතුයි

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 2 කට පිළිතුරු සපයන්න.

(1) 1) කදා වළලු නට්‍යයේ රචකයා නම් කරන්න (ලකුණු 02)
2) එහි චරිත 4 ක් නම් කරන්න (ලකුණු 02)
3) එම නාට්‍ය පෙළෙහි දක්නට ලැබෙන ගැටුම්කාරී අවස්ථාවක් සඳහන් කරන්න (ලකුණු 02)
4) මෙම නාට්‍යය සඳහා පාදක වූ ජාතක කථාව කුමක්ද? (ලකුණු 02)
5) මෙහි බෝසත් චරිතය නම් කරන්න (ලකුණු 02)

(2) නිර්දිෂ්ඨ නාට්‍ය පෙළ හෝ ඔබ නරඹා ඇති ඕනෑම වේදිකා නාට්‍යයක් නම්කර එහි පහත අසන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1) නාට්‍යයේ රංග ශෛලිය (ලකුණු 02)

2) ඔබ දක්වන ලද නාට්‍ය ශෛලිය තහවුරු කිරීම සඳහා කරුණු තුනක් (ලකුණු 03)
පෙන්නුම් කරන්න

3) යොදා ගෙන තිබෙන වේෂ භූෂණ හෝ නාට්‍යය උපකරණ නාට්‍යයේ සාර්ථකත්වයට බලපා ඇති ආකාරය (ලකුණු 05)

(3) (1) වේදිකා නාට්‍ය සඳහා යොදා ගන්නා ආනුෂංගික අංග දෙකක් ලියන්න (ලකුණු 02)

(2) ආනුෂංගික අංග මගින් නාට්‍ය කලාවට ලැබෙන ප්‍රයෝජන තුනක් විස්තර කරන්න (ලකුණු 03)

(3) ඔබ දක්වන ලද එක් ආනුෂංගික අංගයක් සැලසුම් කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් සඳහන් කර විස්තර කරන්න (ලකුණු 05)

(4) (1) අභිනය සතර ලියා දක්වන්න (ලකුණු 02)

(2) එක් අභිනයක් පිළිබඳ විස්තර කරන්න (ලකුණු 03)

(3) නාට්‍යයක් සඳහා අභිනය ප්‍රයෝජනවත් වන ආකාරය පැහැදිලි කරන්න (ලකුණු 05)

(5) (1) ශ්‍රීලංකවේ නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ නාට්‍ය කරුවන් දෙදෙනෙක් නම් කරන්න (ලකුණු 02)

(2) ඔවුන් දෙදෙනාගේ නාටය නිර්මාණ තුන බැගින් වෙන් වෙන්ව ලියන්න (ලකුණු 03)

(3) ඔබ සඳහන් කරන ලද එක් නාටය කරුවෙකුගේ නාට්‍ය වල ඇති විශේෂ ලක්ෂණ පිළිබඳ විමසීමක් කරන්න (ලකුණු 05)

(ලකුණු 3×10=30)